**ශීර්ෂය 4 - උපරිමාධිකරණවල විනිශ්චයකාරවරු**

-----------------------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

උපරිමාධිකරණවල විනිශ්චයකාරවරු 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව උපරිමාධිකරණවල විනිශ්චයකාරවරුන්ගේ වැය ශීර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව වැය ශීර්ෂයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 මැයි 03 දිනප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව ආයතනය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරවඋපරිමාධිකරණවල විනිශ්චයකාරවරුන්ගේ වැය ශීර්ෂයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවයමෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ශීර්ෂ මාරු කර වියදම් දැරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වැය ශීර්ෂ 04 ට අයත් වාහන 02 ක රක්ෂණාවරණ වියදම් රු.61,948 ක් වැය විෂයය 234–01–01–1301 මඟින් ගෙවා තිබුණි | මෙම වාහන ශ්‍රේෂ්ඨාධිකරණයේ කාර්යාලයේ කටයුතු සඳහා භාවිතා කල බැවින්, ශීර්ෂ අංක 234 යටතේ ගෙවීම් සිදුකර ඇත. | ප්‍රතිපාදන වෙන් කර ඇති වැය ශීර්ෂයට අදාල වියදම් එම වැය ශීර්ෂය යටතේ දැරිය යුතු වේ |
| (ආ) | වැය ශීර්ෂ 234 ට අයත් වූ වාහන 03 ක රක්ෂණ වියදම් රු.77,436 ක් වැය විෂයය අංක 04–01–01–1301 යටතේ ගෙවා තිබුණි. | මෙම වාහන ශීර්ෂ අංක 04 යටතේ විනිසුරුවරුන්ගේ නිල රථ හා වෙනත් කටයුතු සඳහා භාවිතා කල බැවින් මෙම වැය ශීර්ෂය යටතේ ගෙවීම් සිදු කරන ලදි. | ප්‍රතිපාදන වෙන් කර ඇති වැය ශීර්ෂයට අදාල වියදම් එම වැය ශීර්ෂය යටතේ දැරිය යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | වැය ශිර්ෂ 234 ට අයත් සංචිත රථයක රු.482,550 ක් වූ අළුත්වැඩියා වියදම වැය විෂයය අංක 04–01–01–1301 මඟින් ගෙවා තිබුණි. | මෙමරථය ගරු විනිසුරුතුමාගේ නිල රථ (බෙන්ස් රථ) අළුත්වැඩියාවට යොමු කරන අවස්ථාවේදී විනිසුරුතුමන්ලාට අනුයුක්ත කරන බැවින් අළුත්වැඩියා වියදම 04 – 01 – 01 – 1301 මඟින් ගෙවීම් කර තිබුණි. | ප්‍රතිපාදන වෙන් කර ඇති වැය ශීර්ෂයට අදාල වියදම් එම වැය ශිර්ෂය යටතේ දැරිය යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය
----------------------

### 2.1 වියදම් කළමනාකරණය
--------------------------

| විගණන නිරික්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2102 සහ 2103 වැය විෂයයන් සඳහා පරිපූරක ඇස්තමේන්තු මඟින් පිළිවෙලින් රු.9,570,000 ක් සහ රු.11,754,000 ක් ද, මුදල් රෙගුලාසි 66/69 මාරු කිරීම් මඟින් පිළිවෙලින් රු.3,200,000 ක් සහ රු.2,297,000 ක් ද ලෙස පිළිවෙලින් රු.12,770,000 ක සහ රු.14,051,000 ක අමතර ප්‍රතිපාදන සලසා ගෙන තිබුණද, වර්ෂය අවසානයට එම වැය විෂයන් වල පිළිවෙලින් රු.12,545,288 ක සහ රු.7,879,482 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබීම නිසා සැලසුමකින් තොරව අමතර ප්‍රතිපාදන සලසාගෙන තිබුණි. | 04–01–02–2102=රු.3,200,000 (කාර්යාල උපකරණ හා ගෘහ භාණ්ඩ) 04–01– 02– 2103 = රු.2,297,000 (යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ ) උපරිමාධිකරණය සඳහා නව විනිසුරුතුමන්ලාගේ පත්වීමත් සමඟම අවශ්‍ය වත්කම් මිලදී ගැනීමට, මිල ගණන් කැඳවීම් සලකා බැලීමේදී අවශ්‍ය ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම නිසා මු. රෙ. 66 යටතේ ප්‍රතිපාදන මාරු කරන ලදි. | අවශ්‍යතාවයට අනුව නිසි සැලසුම් සකස් කර අමතර ප්‍රතිපාදන ලබාගත යුතුය. |

## 2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙහි මාර්ගෝපදේශ අංක 06 හි 3.4 වගන්තිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල බැඳීම් හා බැරකම් ප්‍රකාශය, භාණ්ඩාගාර බැරකම් ප්‍රකාශය සමඟ සැසඳී තිබිය යුතු වුවද, භාණ්ඩාගාර බැඳීම් හා බැරකම් ප්‍රකාශයේ සඳහන් රු.1,180,529 ක් වූ බැරකම් අයිතම 14 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද බැඳීම් ලේඛණයෙහි Sri Lanka Telecomහැර අනිකුත් බැඳීම් අතපසු වීමකින් CIGASහි සටහන් කරන ලද ඒවා වන අතර එය නිවැරදි කිරීමට පියවර ගෙන ඇත. | චක්‍රලේඛයෙහි සඳහන් මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ආ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙහි මාර්ගෝපදේශ අංක 06 හි 3.4 වගන්තිය ප්‍රකාරව හා භාණ්ඩාගාර බැඳීම් හා බැරකම් ප්‍රකාශයේ වාර්තා නොකල කිසිදු බැඳීමක් හෝ බැරකමක් පෙර වර්ෂයේ වියදම් ලෙස නිරවුල් නොකල යුතු වුවද සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබූ රු.70,770 කබැරකම් වියදම් සඳහා 2021 වර්ෂයේ ගෙවීම් කර තිබුණි. | ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයේ අදාල බිල්පත් 2020.12.31 දිනට පසුව ලැබී තිබූ අතර එම ස්වාභාවයේ වියදම් මාසිකව නිරන්තරයෙන් ඇති වන බැවින් ගෙවීම් කටයුතු සිදු කරනු ලබන බව දැනුම් දෙන අතර බැඳීම් යටතේ ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයට රු.62,051.20 ක් ගෙවීම් කිරීමට ඇති බව සටහන් වී ඇත. | චක්‍රලේඛයෙහි සඳහන් මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කල යුතු වේ. |

## 2.3 බැංකු ගිණුම් මෙහෙයවීම

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ බැංකු ගිණුම් පිළිබඳ ප්‍රකාශය අනුව ශේෂය රු.2,334,402 ක් වුවද, සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට නිවැරදි ශේෂය රු.17,759,887 ක් විය. | අතපසු වීමකින් 2020.12.01 දිනට ශේෂය පෙන්වා ඇති අතර 2020.12.31 දිනට ශේෂය රු.17,759,887.03 ක් ලෙස නිවැරදි විය යුතුය. | නිවැරදි තොරතුරු සටහන් කළ යුතුවේ. |
| (ආ) | 2020 මාර්තු24 දිනැතිව ටිනාකම රු.46,600 ක්වූ අංක 751867 දරන චෙක්පත අවලංගු කර ඒ වෙනුවට අංක 752077 දරන චෙක්පත නිකුත් කර තිබූ අතර ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 392(අ)i, 392(ආ) iii, 393(i) හා 393(2) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | 2020.03.24 දිනැති 751867 දරන චෙක්පත තැපැල් මඟින් යොමු කර ඇති අතර මාස 06 කින් පසු කල් ඉක්මවූ අවලංගු චෙක්පතක් වන බැවින් නව චෙක්පතක් නිකුත් කිරීමට පෙර බැකුව වෙත ගෙවීම් අත්හිටුවන ලෙස දැනුම්දී ඇත. 2020.12.08 දිනට මෙම චෙක්පතට මාස 08 කට වැඩි කාලයක් ඉකුත් වීමෙන් පසුව නව චෙක්පතක් නිකුත් කිරීමට කටයුතු කර ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුවේ. |
| (ඇ) | මුදල් රෙගුලාසි 387 පරිදි ආණ්ඩුවේ බැංකු ගිණුමකින් අයිරා පහසුකම් ලබා ගැනීම තහනම් වුවද ඉකුත් වර්ෂයේ දෙසැම්බර් මස 20 සහ 23 දිනවලදී ජංගම ගිණුමේ පිළිවෙලින් රු.3,757,495 ක හා රු.4,901,237 ක අයිරාවක් පැවති අතර 2019 දෙසැම්බර් 31 බැංකුව විසින් රු.8,030 ක අයිරා ගාස්තුවක් අයකර තිබුණි. එසේම සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට ජංගම ගිණුමේ අයිරාව රු.5,030 ක් විය. | 2020 දෙසැම්බර් මස ශීර්ෂ අංක 04 ට අදාල වැටුප් ගෙවීම ශීර්ෂ අංක 234 ට අයත් මෙම බැංකු ගිණුමට මාරු වීම නිසා දෙසැම්බර් 20 හා 23 දිනවලදී බැංකු අයිරා ගාස්තුවක් අයකර ඇත. 2020.12.31 දින මහා භාණ්ඩාගාරයේ බැංකු ගිණුම වෙත මුදල් ප්‍රේෂණය කිරීමෙන් අනතුරුව ඇතිවූ අයිරාව මත රු.200 ක් අයිරා ගාස්තු අයකර ඇත. | මුදල් රෙගුලාසි 387 පරිදි කටයුතු කළ යුතුවේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 වාර්ෂික කාර්යසාධන වාර්තාව

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 14 අනුව වාර්ෂික කාර්යසාධන වාර්තා පිළියෙල කර නොතිබුණි. | අදාල වර්තාව සකස් කරමින් පවතින අතර අවසන් වූ විගස ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතු වේ. |

## 3.2 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ලැප්ටෝප් 14 ක් හා පරිසනක 14 ක් මිලදී ගැනීම වෙනුවෙන් පිළිවෙලින් රු.2,989,000 ක් හා රු.2,529,352 ක් භාණ්ඩ ලැබීමට පෙර අදාල ආයතන වලින් ලබා දී තිබූ කාර්යයසාධන ඉන්වොයිසිය පදනම් කරගෙන ගෙවීම් කර තිබුණි. | ලැප්ටොප් 14 සහ පරිගනක 14 සඳහා වන ඉන්වොයිසි වවුචරයට අමුණා විගණනය සඳහා ඉදිරිපත් කරන ලදි. | ඉල්ලුම් කල භාණ්ඩ ලැබීමෙන් පසු ඉන්වොයිසිය පදනම් කරගෙන ගෙවීම් කල යුතුවේ. |
| (ආ) 2020 දෙසැම්බර් 11 දින වාහන අළුත්වැඩියාවක්සඳහා භාරදී තිබූ අතර,2021 පෙබරවාරි 08 දින වන විටත් අළුත්වැඩියාකටයුතු නිම කර රථය භාරදී නොතිබියදීඑහි සම්පූර්ණ ඇස්තමේන්තු වටිනාකම වූ රු.1,891,250 ක්2020 දෙසැම්බර් 31 දින ගෙවා තිබුණි. | රථයේ අමතර කොටස් කිහිපයක් මව් ආයතනයෙන් ගෙන්වා ගැනීමට අවශ්‍ය වන බැවින් රථය අලුත්වැඩියාව නිම කර භාරදීමට මාස 03 ක පමණ කාලයක් ගතවන බව ඉංජිනේරුවරයා දැනුවත් කර ඇත. ඉංජිනේරුවරයාගේ අධීක්ෂණය යටතේ කාර්ය සිදුවන බැවින් එම අමතර කොටස් ගෙන්වා ගැනීමට අවශ්‍ය බව ඉංජිනේරුවරයා විසින් පවසන ලදි. එබැවින් විගණන දිනය වන විට රථය ශ්‍රේෂ්ඨාධිකරණයවෙත ලැබී නොතිබුණි. | අළුත්වැඩියාව නිසි පරිදි ඉටුකර ඇති බවතහවුරු කර ගැනීමෙන් ඉන්වොයිසිය පදනම් කරගෙන ගෙවීම් කල යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2020 ඔක්තෝබර් සහ දෙසැම්බර් මාස වල පවත්වා තිබූ තාක්ෂණික ඇගයීම් කමිටු හාප්‍රසම්පාදන කමිටු තීරණ 14 ක් සඳහා, ඒ ඒ කමිටු සාමාජිකයින්ගේ එකඟතාවයන් 2021 පෙබරවාරි 15 දින වන විටත් ලබා දී නොතිබුණි. | ටෙන්ඩර් කමිටු රැස්වීම් පැවැත්වෙන වේලාවේදී කමිටුවේ සභාපති සහ සාමාජිකයින් විසින් එකඟතාවය මත ගන්නා නිර්දේශ සහ තීරණය කමිටුව සටහන් කර ගනිමින් පසුව වාර්තා සකසා අත්සන සඳහා යොමු කරන ලදි. වාර්තා සැකසීමේ ප්‍රමාදය මත සාමාජිකයින්ගෙන් අත්සන් ලබා ගැනීමට ප්‍රමාද විය. | රැස්වීමේ දී ගන්නා තීරණ සහ නිර්දේශ වෙනුවෙන් එකඟතාවය එම අවස්ථාවේදී ලබා ගත යුතු අතර ප්‍රමාදයන් වලක්වා ගැනීමට කටයුතු කල යුතු වේ. |

**3.3 වත්කම් කළමනාකරණය**

| විගණන නිරික්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2013 වර්ෂයේදී අධිකරණ අමාත්‍යාංශයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයට ලබාදී තිබූ වාහනයක අයිතිය පවරා ගැනීමට 2021 පෙබරවාරි 03 වන විටත් කටයුතු කර නොතිබුණි. | අදාල රථයේ අයිතිය ශ්‍රේෂ්ඨාධිකරණය වෙත පවරා ගැනීමට අවශ්‍ය කටයුතු කඩිනමින් සිදු කිරීමට පියවර ගන්නා බව කාරුණිකව දන්වා සිටිමි. | 2017 දෙසැම්බර් 21 දිනැති අංක 02/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයෙහි 2(i) ප්‍රකාරවකටයුතු කළයුතු වේ. |